# බළන්ගොඩ නගර සභාව

## 2026-03-26 දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** **- බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය** **- 2026.03.26**

**වේලාව** **-පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති එන්.ඩබ්.පී.ටී ජයසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | එන්.ඩබ්.පී.ටී ජයසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී පේමදාස මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 6.ගරු නාගරික මන්ත්‍රිනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 7.ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් චන්දන මැතිතුමා |
| 8.ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්.එච්.ඒ කරුණාරත්න මිය |

මෙදින විශේෂ මහ සභාවේ වැඩ කටයුතු පෙ.ව. 10.00 ට ආරම්භ කළ ගරු සභාපතිතුමන් විශේෂ මහ සභාව සඳහා සහභාගී වූ ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා සහ සභාවේ කාර්ය මණ්ඩලය පිළිගන්නා ලදී.අනතුරුව ප්‍රථමයෙන්ම නව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාට ඉදිරි වැඩ කටයුතු සිදු කිරීමට සුභාශිංශන පිරිනමන ලදී.

**01. අක්කර 18 මාර්ගයේ බෝක්කුව ඉදිකිරීමේ කර්මාන්තයට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

I. කේ.ආර්.ඩී කරුණානායක මහතා-විධායක ඉංජිනේරු-විධායක ඉංජිනේරු කාර්යාලය බළන්ගොඩ (සභාපති)
II. ඊ.ජී.ඒ.සී හේමපාල මිය-ගණකාධිකාරී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (සාමාජික)
III. එම්.එන්.පී මුණසිංහ මයා-කාර්මික නිලධාරී -බළන්ගොඩ නගර සභාව (සාමාජික)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**02.අක්කර 18 මාර්ගයේ බෝක්කුව ඉදිකිරීමේ කර්මාන්තයට අදාළ ටෙන්ඩර්පත් විවෘත කිරීම.**

අක්කර 18 මාර්ගයේ බෝක්කුව ඉදිකිරීමේ කර්මාන්තයට අදාළ ටෙන්ඩර්පත් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරන ලදී.

බළන්ගොඩ අක්කර 18 මාර්ගයේ බෝක්කුව රු.2,995,000.00ක ඇස්තමේන්තුවක් යටතේ ඉදිකිරීමේ කර්මාන්තය සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට වෙළඳපොළ මිල සැසඳුම් ක්‍රමය යටතේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙතින් මිල ගණන් කැඳවූ අතර ඒ වෙනුවෙන් ටෙන්ඩර්පත් 01ක් නිකුත් වී තිබූ අතර අදාළ ලංසු මුදල් පහත පරිදි ඉදිරිපත් කර තිබුණි.

| කොන්ත්‍රාත්කරු | ඉදිරිපත් කර ඇති ලංසු මුදල(රු.) |
|---|---|
| OK කන්ස්ට්‍රක්ෂන් | 2,993,106.25 |

මෙම කර්මාන්තය සඳහා එක් කොන්ත්‍රාත්කරුවෙකු පමණක් මිල ගණන් යොමු කර ඇති බැවින් එය ගැටළුකාරී බැවින් කරුණු සාකච්ඡා කිරීම සඳහා මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙසට ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඉහත කර්මාන්තය සඳහා ප්‍රසම්පාදන ක්‍රමය වන වෙළඳපොළ මිල සැසඳුම් ක්‍රමය මත මිල ගණන් කැඳවීම ගැටළුකාරී බවත් කර්මාන්ත කමිටුවේ ලබා ගත් තීරණය මහ සභා අනුමැතියක් ලබා ගැනීමකින් තොරව මෙලෙස මිල ගණන් විවෘත කිරීම වැරදි බවත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සඳහන් කලේ කර්මාන්ත කාරක සභාවේදී ඉහත කර්මාන්තය සම්බන්ධව වෙළඳපොළ මිල සැසඳුම් ක්‍රමය මත මිල ගණන් කැඳවීමට තීරණය කිරීමේදී තමන් සිටි බවත්, එහිදී ලක්ෂ 34ක්ව පැවති ඇස්තමේන්තුව ලක්ෂ 30ක් දක්වා අඩු කරන ලද්දේ ප්‍රසම්පාදන කාර්යය සඳහා ගතවන කාලය සලකා බලා බවත්, නමුත් එහි ඇති නීත්‍යානුකූල තත්වය පිළිබඳව ඉදිරියට ගැටළුවක් පවතීනම් එම කර්මාන්තයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නීත්‍යානුකූලව සිදු විය යුතු බවත්, වැරදි වංචා සිදු කිරීමට කිසිසේත්ම අනුමත නොකරන බවත්, ඒ අනුව කර්මාන්ත කාරක සභාවේදී ලබා ගත් තීරණයට තමන් මෙම අවස්ථාවේ විරුද්ධ වන බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ මෙම කර්මාන්තයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ ඉදිරි මහ සභාවක් වෙත යොමුකරන බවයි.ඒ අනුව ඉහත කර්මාන්තය සඳහා සුදුසු බඳුකරුවෙකු තෝරාගැනීම පිළිබඳ සභාවේ නිශ්චිත තීරණයක් නොවීය.

**03. පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම මත සකස් කළ 2025 වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රකාශ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඉහත ඉදිරිපත් කර ඇති යෝජනාව පිළිබඳ ගණකාධිකාරිතුමියගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති නදීභාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**04. නාගරික සංවර්ධන අධිකාරියට අයත් බළන්ගොඩ බස්නැවතුම්පොළ ඉදිරිපිට පිහිටි ඉඩම මාස 06 ක කාල සීමාවකට රු.75,000.00ක මාසික කුලී පදනම මත තාවකාලික බස්රථගාලක් පවත්වාගෙන යාම සඳහා සභාවට ලබා දීමට එම අධිකාරියෙන් අනුමැතිය ලැබී ඇත.ඒ අනුව එම ඉඩම තාවකාලික පරිහරණය සඳහා ලබා ගැනීමට එකඟවන්නේ නම් ගෙවිය යුතු මුළු මුදල වන රු.619,275.00 ක මුදල දින 14ක් ඇතුළත ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා ඇති බැවින් එකී මුදල ගෙවීම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඉහත යෝජනාව පිළිබඳ අදහස් දැක්වූ ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් යොමුකර ඇති කොන්දේසි ඇතුළත් ලිපිය කියවූ බවත්, ඒ අනුව එයින් ලැබිය හැකි විශාල ලාභයක් හෝ ප්‍රගතියක් නොමැති බවත්, බස් රථගාලක් පවත්වා ගෙන යාමට පමණක් අවසර ලබා දී ඇති බැවින් වෙනත් අංග පැවැත්විය නොහැකි බවත්ය.

ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉහත නාගරික සංවර්ධන අධිකාරිය යොමුකර ඇති කොන්දේසි ඇතුළත් ලිපිය සභාගත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ මෙය බළන්ගොඩ නගරයට අත්‍යාවශ්‍යම කාරණාවක් බවත්, දැනට නගරයේ බොහෝ අවස්ථාවල බස් රථ නවත්වා තිබෙනුයේ bypass මාර්ගයේ බවත්, නීත්‍යානුකූලව එම මාර්ගවල බස් රථ නවත්වා තිබිය නොහැකි බවත්, එමෙන්ම එම වාහනවලින් ඉවත්කරන කසළ හේතුවෙන් දොරවෙල ඔය ගඟ දෙපස විශාල ලෙස අපවිත්‍ර වී ඇති බවත්, එයද නගරයට විශාල ගැටළුවක් බවත්, පළාත් පාලන ආයතන යනු ලාභ ලබන ආයතන නොව සේවා සපයන ආයතන බවත්, ඒ අනුව මෙහිදී ලාභය ඉලක්ක කර නොගන්නා ලෙසත්, මෙහි යම් ආදායමක් ලැබිය හැකි බවත්ය.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසූයේ නගරයේ බස් රථ හිමියන් බස් රථ ආරක්ෂිතව නැවැත්වීමට ස්ථානයක් නොමැති හේතුවෙන් බස් රථ නිවෙස් කරා රැගෙන යන බවත්, ඒ අනුව මෙම බස් රථ ගාල ආරම්භ කිරීම එවැනි බස් රථ හිමියන්ටද අස්වැසිල්ලක් වනු ඇති බවත්,එමෙන්ම ඉදිරි උත්සව සමයේ ජනතාව වෙත ආරක්ෂිතව වාහන නැවැත්විය හැකි ස්ථානයක් ලැබෙන බවත්, මේ සඳහා තමන් පුද්ගලිකවම මහන්සි වූ බවත්, ඊට අදාළ අනුමැතිය ලබා දි ඉදිරි කටයුතු සිදු කරන ලෙසත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා ඉහත යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් පවසා සිටියේ ඉහත බස් රථගාල ස්ථාපිත කිරීම මඟින් නගරයේ විවිධ ස්ථානවල බස් රථ එකම තැනක නැවැත්වීමට හැකි බවත්, එම බස් රථ හිමියන්ට අවශ්‍ය පහසුකම් ලබා දි විධිමත්

පරිදි එය පවත්වාගෙන යා යුතු බවත්, එමඟින් ඉහළ ආදායමක් ලබා ගත හැකි බවත්, ඒ සඳහා අවශ්‍ය සම්පූර්ණ අනුමැතිය ලබා දෙන බවත්ය.

මාස 06ක කාලසීමාව තුළ ඉහත ඉඩම නගර සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන්නේ නම් එය වටිනා බවත්, ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ජේමදාස මැතිතුමා වැඩිදුරටත් කරුණු දක්වමින් පැවසිය.ගරු සභාපතිතුමා පැවසූයේ මාස 06ක කාලසීමාව තුළ අධ්‍යයනක් සිදු කර ලැබෙන ආදායම පිළිබඳ සලකා බැලිය හැකි බවත්, නමුත් සැණකෙළි ආදිය පැවැත්වීමට අතුරු බදු දීමේ හැකියාවක් නොමැති බවත්, එවැනි අවස්ථා සඳහා නාගරික සංවර්ධන අධිකාරිය ඉඩම ලබා ගන්නේ නම් එම දින ගණන්වල කුලිය පිළිබඳව එම අධිකාරිය සලකා බලනු ඇති බවත්, එය තමන් පුද්ගලිකව සිදුකළ සාකච්ඡාවකදී පැවසූ බවත්, නමුත් එසේ ලබාදිම සභාවට පාඩුවක් වන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් පැවසූයේ ඉහත බස්රථ නැවතුම්පොළ සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් මෙම ඉඩම බදු පදනම ලබා ගැනීම සම්බන්ධව තමන්ද හිටපු ගරු සභාපති කේ.ජී ජේමදාස මැතිතුමාගෙන් ඉල්ලීම් කළ බවත්, එතුමා විශාල වෙහෙසක් දරා මේ සඳහා අනුමැතිය ලබා ගැනිම සම්බන්ධව එතුමාට ස්තූතිවන්ත වන බවත්, මෙය ක්‍රියාත්මක කිරීම මඟින් සභාවට පාඩුවක් සිදුනොවන බවත්, බස් රථගාල් ගාස්තු අයකිරීමේ ටෙන්ඩර්කරුට පුද්ගලික වාසි ලබා දීමට මෙය වළක්වාලන මන්ත්‍රීවරයෙක්ද සිටින බවත්, මෙය නගරයට අත්‍යවශ්‍ය දෙයක් බවත්, මුල් මාස 06 ලැබෙන ආදායම පිළිබඳව සලකා බැලිය හැකි බවත්, මෙය ක්‍රියාත්මක කළ යුතු බවත්ය.

මෙහිදී ගරු සභාපතිතුමන් පැවසූයේ හිටපු ගරු සභාපති කේ.ජී ජේමදාස මැතිතුමා මේ සඳහා මුල් වී ක්‍රියාකළ බවත්, එතුමාගේ අදහස පල දරා ඇති බවත්, මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව කිසිදු ගැටළුවක් නොවන බවත්, සභාවේ සේවකයෙක් යොදවා ඔහුගේ වැටුප සහ ඉඩමේ බදු කුලිය ගෙවීමට මූලික වටයේ හැකියාවක් ලැබේනම් එය ප්‍රමාණවත් බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ සභාවේ මුරකරුවෙකු යොදවා පවත්වා ගෙන යා හැකි බවත්, මේ සඳහා දැන්ම ක්‍රියාත්මක වන්නේ නම් අප්‍රේල් මස මුල සිටම මෙය ආරම්භ කළ හැකි බවත්ය.

මේ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ආදිය සැපයීමේදි එමඟින් චක්‍රව රැකියා අවස්ථා උදාවන බවත්, එහිදී පදික වේදිකාවේ සිටින වෙළෙන්දන්ටද අවස්ථාවක් ලබා දිය හැකි බවත්, එහිදී විනිවිදභාවයකින් කටයුතු කළ යුතු බවත්, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සඳහන් කරන ලදී.ගරු සභාපතිතුමා පැවසූයේ මෙහි ගාස්තු අයකිරීම සම්බන්ධව ඉදිරි සභාවක් වෙත යොමුකර තීරණය කළ යුතු බවයි.

මේ සමඟම බළන්ගොඩ නගරයේ හෙළ බොජුන්හලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහාද අවශ්‍ය කටයුතු සිදුකිරීමට නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කළ යුතු බව ගරු නාගරික

මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පවසන ලදී.ඒ අනුව ගරු සභාපතිතුමා පැවසුයේ එම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදුවන බවත්, ඉඩම ලබා ගත් පසු ප්‍රජා ශක්ති අරමුදල මඟින් මේ සඳහා ප්‍රතිපාදන ලබා ගත හැකි බවත්ය.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ මෙම බස් රථගාල් ව්‍යාපෘතිය ආරම්භ කළ පසු නගරයේ රථවාහන නැවැත්වීම් ගාස්තු අයකිරීමේ ටෙන්ඩරය පිළිබඳව ගැටළුවක් ඇතිවන බවත්, ඒ අනුව එම මෙය ටෙන්ඩර් කිරීමක් සිදුකරවාද යන්න පිළිබඳව විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ සභාවෙන් සිදු කිරීමට අපේක්ෂා කරන බවත්,ටෙන්ඩර්කරුගෙන් අදාළ විමසීම් පැමිණෙනු ඇති බවත්ය.

එ අනුව ගරු සභාපතිතුමා පැවසුයේ ඉදිරි උත්සව සමයට ප්‍රථම ඉහත බස්රථගාල ආරම්භ කිරීමේ කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 11. අවසානය

අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව වෙත සහභාගී වී අදදින විශේෂ මහ සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සඳහා වෙතද ස්තූතිය පුදකරමින් පෙ.ව.11.00 ට පමණ මෙදින විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

**එන්.ඩබ්.පී.ටී ජයසේන,**
සභාපති,
බළන්ගොඩ නගර සභාව.